# ගා/ මාපලගම සිරිසුනන්ද මහා විද්‍යාලය

## පුරවැසි අධ්‍යාපනය

**9 ශ්‍රේණිය** **පළමු වාර පරීක්ෂණය - 2022** **කාලය පැය - 1. වි 30**

**නම:** ..............................................................................................................................................

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **1 - 5 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

01. සෑම පුද්ගලයෙකුටම බියෙන් සැකයෙන් තොරව යහපත් ලෙස ජීවත් වීමට නම් සමාජයෙන් .............................. හිමි විය යුතුය.
(රැකවරණය හා මුදල් / අධ්‍යාපනය හා ආරක්ෂාව / රැකවරණය හා ආරක්ෂාව)

02. රටක පාලනය කටයුතු හා සම්බන්ධ උත්තරීතර නීතිය වන්නේ .....................................යි.
(අධිකරණ වාර්තා / ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව / දණ්ඩ නිති සංග්‍රහය)

03. ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර වැනි වැරදි සම්බන්ධ නීති .................................යටතට අයත් වේ.
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය / අපරාධ නීතිය / සිවිල් නීතිය)

04. "ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී" යන්න .................................. ආදර්ශ පාඨයයි.
(අධිකරණයේ / ශ්‍රී ලංකා පොලීසියේ / පාසලේ)

05. රජයේ සියලුම නීතිමය කටයුතු සම්බන්ධ වගකීම ....................................සතුව පවතී.
(ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුව / අධිකරණ පද්ධතිය / පොලිස් දෙපාර්තමේන්තුව)

- **අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශය හරි නම් (√ ) ලකුණ ද වැරදි නම් (×)වැරදි ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා පත්කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. (   )

07. ජාතික වශයෙන් වැදගත් වන කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී රජයට සහාය වීම ත්‍රිවිධ හමුදාවේ වගකීමකි. (   )

08. රටක ව්‍යවස්ථාදායකය යුක්තිය පසිඳලන ආයතනයයි.(   )

09. සමථ මණ්ඩලය යනු ජනතාවට ඇති ඕනෑම ආරවුලක් විසඳා ගත හැකි විකල්ප ආයතනයකි. (   )

10. ළමුන් සඳහා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම ළමා ආරක්ෂක අධිකාරියේ මෙහෙවරයි. (   )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වඩාති නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනය වන්නේ,
i. මානව හිමිකම් කොමිෂන් සභාවයි.
ii. පොලීසියයි.
iii. ළමා ආරක්ෂක අධිකාරියයි.
iv. නීතිපති දෙපාර්තමේන්තුවයි.

12. තම කටයුතු වඩා පහසු කර ගැනීම සඳහා මිනිසා විසින් යොදා ගන්නා ක්‍රම වේදයන් කුමක්ද?
i. අධ්‍යාපනයයි
ii. ස්වභාව ධර්මයයි
iii. තාක්ෂණයයි
iv. යන්ත්‍රසූත්‍රයි

13. විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් ගැටලුවකට විසඳුම් සොයා කරනු ලබන අධ්‍යයන ක්‍රමය හඳුන්වන්නේ,
i. ගවේෂණය යනුවෙනි.
ii. පර්යේෂණය යනුවෙනි.
iii. නිෂ්පාදනය යනුවෙනි.
iv. නිරීක්ෂණය යනුවෙනි.

14. වර්තමාන කටයුතු සඳහා සම්පත් යොදාගෙන පරිසරයට හානියක් නොවන ආකාරයට සිදු කරන සංවර්ධනය හඳුන්වන නම කුමක්ද?
i. ධරණී සංවර්ධනයයි.
ii. තිරසාර සංවර්ධනයයි.
iii. පරිසර සංවර්ධනයයි.
iv. ආර්ථික සංවර්ධනයයි.

15. ළමා හිංසනය හා අපචාර පිළිබඳ දැනුවත් කිරීමේ සෘජු දුරකථන අංකය වන්නේ මින් කුමක්ද?
i. 1919ය. ii. 1990ය. iii. 1929ය. .iv. 1939ය.

- **16 සිට 20 දක්වා ප්‍රශ්න වල කොටසට ගැළපෙන පිළිතුර කොටසට යා කරන්න.**

| | |
|---|---|
| 16. පොලිසියේ කාර්යයකි. | රජය වෙනුවෙන් නඩු වලට පෙනී සිටියි. |
| 17. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යයකි. | ආරක්ෂිත ලෙස වාහන ධාවනයට යොමු කරයි. |
| 18. නාවික හමුදාවේ ප්‍රධාන කාර්යයකි. | නීති ගරුක හා මානව හිතවාදී යහපත් පුරවැසියන් සමාජ ගත කිරිම. |
| 19. රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ දක්ම | දූපත් අතර ප්‍රවාහන පහසුකම් සැපයීම. |
| 20. නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යයකි. | සාධාරණ හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම. |

(2 X 20 = 40)

II කොටස

01.

i. සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලකින් ඉටු විය යුතු කාර්යයන් 2 ක් ලියන්න
ii. එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීමට පුද්ගලයින් පිහිටුවාගෙන ඇති සමාජ ආයතන 2 ක් ලියන්න.
iii. නීතියේ මූලාශ්‍ර 2 ක් ලියන්න.
iv. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව හා එක්ව කටයුතු කරන ආයතන 2 ක් නම් කරන්න.
v. අධිකරණය හා සම්බන්ධ පුද්ගල වගකීම් හා යුතුකම් 2 ක් සඳහන් කරන්න.
vi. තාක්ෂණික වෙනස්වීම නිසා ඇති වන හිතකර බලපෑමක් හා අහිතකර බලපෑමක් වෙන් කර ලියා දක්වන්න.
vii. තේ නිෂ්පාදනය විවිධාංගකරණය වී ඇති ක්‍රම දෙකක් ලියන්න.
viii. පන්සල් අධ්‍යාපනයේ දී ලිවීම සඳහා භාවිතා කළ මාධ්‍යයන් 2 ක් ලියන්න.

02.

i. අපරාධ නීතිය යටතේ දඬුවම් කෙරෙන වැරදි 03ක් සඳහන් කරන්න.
ii. නීතිය බලාත්මක කිරීම සඳහා පවතින ආයත 03 ක් ලියන්න.
iii. අ) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා කවුද?
ආ) ඔහුව පත් කිරීමේ බලධාරියා වන්නේ කවුද
ඇ) නීතියේ ගුණාංග 03 ක් ලියන්න.


03.



i. රූපයෙන් දැක්වෙන නිල ලාංඡනය අයත් ආයතනය නම් කරන්න.
ii. එම ආයතනය මඟින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් 2 ක් ලියන්න.
iii. අ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ඉහළම අධිකරණ ආයතන දෙක නම් කරන්න.
ආ) අධිකරණය හා සම්බන්ධ පුද්ගල වගකීම් හා යුතුකම් 4 ක් ලියන්න.

04.

i. තාක්ෂණය යන්න හඳුන්වන්න.
ii. තාක්ෂණයත් සමඟ නිවාසවල සිදු වූ වෙනස්වීම් පහත රූපවලින් දැක්වේ ඒවා හඳුනාගෙන නම් කරන්න.




ii. අ) තාක්ෂණික වෙනස්වීම් නිසා ඇති වන අහිතකර බලපෑම් 4 ක් ලියන්න.
ආ) වර්තමානයේ තාක්ෂණය යොදා ගන්නා අවස්ථා 2 ක් ලියන්න.

(4 X 15 = 60)